සැ. යු. - 2024.05.31 දින පළ වූ අංක 2387 *ගැසට් පත්‍රයේ* I/I සහ IV(අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,388 - 2024 ජූනි මස 07 වැනි සිකුරාදා - 2024.06.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු .... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 524 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 524 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**
**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 ජූනි 28 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 ජූනි 14 වැනි දින දහවල් 12 00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පළාත් පාලන නිවේදන

## උඩුනුවර ප්‍රාදේශීය සභාව

ගෝඝාතක ආඥාපනත (271 වැනි අධිකාරය)

මෙහි පහත උපලේඛනයේ සඳහන් ස්ථානයේ ගවමස් වෙළෙඳාම් කිරීම, සඳහා 2024 වර්ෂයට බලපත්‍ර ලබාදෙන ලෙසට ඉල්ලීම් කර ඇති බවට ගෝඝාතක ආඥාපනත 7(2) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. මෙම බලපත්‍ර ලබා දීමට විරෝධතාවයන් පවතී නම් උඩුනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචි ඕනෑම අයෙකුට විරෝධතා ඉදිරිපත් කළ හැකිය. එම විරෝධතාවලට හේතු සහිතව පිටපත් 02 කින් යුක්ත ලියවිල්ලක් මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට දින 14ක් (දින දාහතරක්) ඇතුළත මා වෙත ඉදිරිපත් කරන ලෙස කාරුණිකව දන්වමි.

| *නම හා ලිපිනය* | *වෙළෙඳ ස්ථානයේ ලිපිනය* | *වෙළෙඳාම් කරන මස් වර්ගය* |
|---|---|---|
| ඒ. එම්. සාරුක් මයා | අංක 153/C/A, බුවැලිකඩ, ලීමගහකොටුව | ගවමස් |

එස්. කේ. ගුණසේකර,
ලේකම්,
උඩුනුවර ප්‍රාදේශීය සභාව,
ගෙලිඔය.

2024 මැයි මස 30 වැනි දින,
ගෙලිඔය,
උඩුනුවර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

06-37

---

# විවිධ දැන්වීම්

## පච්චිලෙයිපල්ලි ප්‍රාදේශීය සභාව - පලෙයි

ත්‍රීරෝද රථ ගාල ප්‍රසිද්ධ කිරීම

පළාත් සභාවේ පළාත් පාලන කටයුතු භාර අමාත්‍යවරයාට හිමි බලතලවලට අනුව උතුරු පළාත් පාලන කටයුතු භාර අමාත්‍යවරයා විසින් සකස් කර 2016.02.02 වන දිනැති අංක 1952/16 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මඟින් ප්‍රසිද්ධියට පත් කරන ලද අතුරු ව්‍යවස්ථා මඟින්ද අපගේ සභාවේ අංක 2029 දරන 2017.07.21 වන දිනැති *ගැසට් පත්‍රයේ* පිළිගත් අතුරු ව්‍යවස්ථා ප්‍රකාශය සමග පහත සඳහන් දෑ එකතු කිරීම සමග කියවන අතර සභාවට පැවරී ඇති බලතල අනුව සහ පච්චිලෙයිපල්ලි ප්‍රාදේශීය සභාවට අයත් ප්‍රදේශයේ නැවතුම්පොළවල් සංවිධානය කරන අයුරෙන් ද ත්‍රීරෝද රථ ධාවනයට යෙදවීම සඳහා පහත සඳහන් ත්‍රීරෝද රථ ගාල 2024.03.15 දින සිට අවසර ලත් රථ ගාල් ලෙස ප්‍රකාශයට පත් කරන බව අංක 24 දරන 2024.02.06 දිනැති පරිපාලන නියෝගය සම්මත කරන ලදී. මේ අනුව ත්‍රීරෝද රථ ක්‍රියාකරුවන්ට සභාවෙන් අවසර ගෙන නියමිත රථ ගාල්වල නතර වී තම සේවාවන් සපයන ලෙස දැනුවත් කරනු ලැබේ. තව ද මේ සඳහා එක් ත්‍රීරෝද රථයක් සඳහා රුපියල් 300.00 ක මාසික ගාස්තුවක් අය කරන බව මෙයින් දන්වා සිටිමි.

01. පලෙයි බස් නැවතුම්පොළට බටහිර දිසාවේ ඇති සභාවේ බිම් කොටස.
02. පුදුක්කාට්ටු හංදියේ සභාවට අයත් බිම් කොටස.
03. ඉයක්කච්චි පොළ ඉදිරිපිට පෙදෙස.

ත. දර්ශනී,
ලේකම්,
පච්චිලෙයිපල්ලි ප්‍රාදේශීය සභාව,
පලෙයි.

06-17

## පේදුරුතුඩුව නගර සභාව

**යෝජනා අංක : 84/2024 - 14.05.2024**

1. 1939 වර්ෂයේ නගර සභා ආඥාපනතේ 255 වන පරිච්ඡේදයට අනුව පේදුරුතුඩුව නගර සභා බල ප්‍රදේශය තුළ පොදු ස්ථාන හා පාර අසල නවත්වන රජයේ වාහන, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවා වාහන, යතුරු පැදි, පාපැදි හැර අනෙකුත් වාහනවලට පැයක් සඳහා නැවතීමේ ගාස්තු පහත සඳහන් පරිදි අය කිරීමට තීරණය කරමි. මෙම ගාස්තු සියල්ල 2024.06.01 දින සිට අය කරනු ලැබේ. මෙම ගාස්තු රජයේ බදු බැහැරව ඇත.

| | | *රු. ශත* |
|---|---|---|
| අ. | බර වාහන | 200.00 |
| ආ. | ලොරි, බස් රථ | 100.00 |
| ඇ. | වෑන්, බට්ටා, මිනිබස්, මධ්‍යම මට්ටමේ වාහන | 50.00 |
| ඈ. | ත්‍රී රෝද වාහන | 30.00 |

**යෝජනා අංක : 85/2024 - 14.05.2024**

2. 1939 වර්ෂයේ නගර සභා ආඥාපනතේ 255 වන පරිච්ඡේදය අනුව කුණු කසළ, ප්ලාස්ටික් බඩු, පොලීතීන් ඇතුළත් අනෙකුත් අපද්‍රව්‍ය නගර සභා බල ප්‍රදේශය තුළ පොදු ස්ථාන, වීදි හා ඉඩම්වල නීති විරෝධී ලෙස දමන අයගෙන් රු.5000.00ක දඩ මුදලක් අය කරන බව තීරණය කරමි. මෙම ක්‍රියා මාර්ගය 2024.06.01 දින සිට ක්‍රියාත්මක කරනු ලැබේ.

**යෝජනා අංක : 86/2024 - 14.05.2024**

3. 1939 වර්ෂයේ නගර සභා ආඥාපනතේ 255 වන පරිච්ඡේදයට 2023.12.29 වැනි දින අංක 2365 දරන *ගැසට්* පත්‍රයේ පළකරන ලද පහත සඳහන් විෂයයන් සඳහා ගාස්තු පහත සඳහන් පරිදි සංශෝධනය කර ඇත. මෙම ගාස්තු සියල්ල 2024.06.01 දින සිට අය කරනු ලැබේ. මෙම ගාස්තු සියල්ල රජයේ බදු බැහැරව ඇත.

අ. මළ කසළ හා ඉස්සන්, කකුළු ජල අපද්‍රව්‍ය ඉවත් කිරීමේ සේවා ගාස්තු (ගලිබවුසර්) එක් වරක් සඳහා

| | | | *රු. ශත* |
|---|---|---|---|
| 1. | නගර සභා සීමාව තුළ | - | 12,000.00 |
| 2. | නගර සභා සීමාවෙන් පිට | - | 12,000.00 + කි.මී. එකට රු. 200.00 |

ආ. කුණු වතුර හා ආහාර ජල අපද්‍රව්‍ය ඉවත් කිරීමේ සේවා ගාස්තු (ගලිබවුසර්) එක් වරක් සඳහා

| | | | |
|---|---|---|---|
| 1. | නගර සභා සීමාව තුළ | - | 8,000.00 |
| 2. | නගර සභා සීමාවෙන් පිට | - | 8,000.00 + කි.මී. එකට රු. 200.00 |

ඇ. කැළි කසළ ඉවත් කිරීමේ ගාස්තු - ට්‍රැක්ටර් ලෝඩ් එකක් සඳහා

| | | | |
|---|---|---|---|
| 1. | නගර සභා සීමාව තුළ | - | 3,000.00 |
| 2. | නගර සභා සීමාවෙන් පිට | - | 3,000.00 + කි.මී. එකට රු. 200.00 |

ඈ. කැළි කසළ ඉවත් කිරීමේ ගාස්තු - ට්‍රැක්ටර් ලෝඩ් භාගයක් සඳහා

| | | | |
|---|---|---|---|
| 1. | නගර සභා සීමාව තුළ | - | 2,000.00 |
| 2. | නගර සභා සීමාවෙන් පිට | - | 2,000.00 + කි.මී. එකට රු. 200.00 |

තාරණී ගජරූබන්,
ලේකම්,
පේදුරු තුඩුව නගර සභාව.

2024 මැයි මස 30 වැනි දින,
නගර සභා කාර්යාලය,
පේදුරු තුඩුව.

06-29

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සලකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2024 වර්ෂය** | | | |
| **ජුනි** | 2024.06.07 | සිකුරාදා | 2024.05.22 | බදාදා | දහවල් | 12.00 |
| | 2024.06.14 | සිකුරාදා | 2024.05.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.06.20 | බ්‍රහස්පතින්දා | 2024.06.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.06.28 | සිකුරාදා | 2024.06.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ජූලි** | 2024.07.05 | සිකුරාදා | 2024.06.20 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2024.07.12 | සිකුරාදා | 2024.06.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.07.19 | සිකුරාදා | 2024.07.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.07.26 | සිකුරාදා | 2024.07.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අගෝස්තු** | 2024.08.02 | සිකුරාදා | 2024.07.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.08.09 | සිකුරාදා | 2024.07.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.08.16 | සිකුරාදා | 2024.08.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.08.23 | සිකුරාදා | 2024.08.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.08.30 | සිකුරාදා | 2024.08.16 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.